# විසර්ජන ශීර්ෂය 257 -කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
# විගණකාධිපති වාර්තාව -2011 වර්ෂය

---

1.1 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිළිඳුකම අඩුකිරීම සඳහා මුල පිරීම
(ආ) මැතිවරණ සම්බන්ධීකරණය
(ඇ) සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කිරීම හා අධීක්ෂණය කිරීම
(ඈ) ආපදා සහන ව්‍යාපෘති හා පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය
(ඉ) දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා මහපෙන්වීම
(ඊ) ආදායම් එකතුකිරීම

1:2 **දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) කළුතර
(ආ) පානදුර
(ඇ) බණ්ඩාරගම
(ඈ) හොරණ
(ඉ) බුලත්සිංහල
(ඊ) දොඩන්ගොඩ
(උ) බේරුවල
(ඌ) මතුගම
(එ) අගලවත්ත
(ඒ) වලල්ලාවිට
(ඔ) පාලින්දනුවර
(ඕ) මදුරාවල
(ක) මිල්ලනිය
(ග) ඉංගිරිය

1:3 **විගණන විෂය පථය**

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 පෙබරවාරි 21 දින දිසත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1:4 **<u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම</u>**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම්කිරීම, ක්‍රියාත්මකකිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. **<u>ගිණුම්</u>**

2:1 **<u>විසර්ජන ගිණුම</u>**

(අ) **<u>මුළු ප්‍රතිපාදනය හා වියදම</u>**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.531,650,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.527,482,119 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.4,167,881 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.78 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | 2011 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 453,600,000 | 466,600,000 | 3,089,415 | 0.66 |
| මූලධන | 65,050,000 | 65,050,000 | 1,078,466 | 1.66 |
| එකතුව | 518,650,000 | 531,650,000 | 4,167,881 | |

(ආ) **<u>වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය</u>**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 18 ක් විසින් රු. මිලියන 2,335 ක ප්‍රතිපාදනද, දෙපාර්තමේන්තු 14 ක් විසින් රු. මිලියන 1,423 ක ප්‍රතිපාදනද වශයෙන් එකතුව රු. මිලියන 3,758 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබී තිබුණු අතර ඉන් පිළිවෙලින් රු. මිලියන 1,680 ක් හා රු. මිලියන 1,380 ක් වශයෙන් රු. මිලියන 3,060 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 698 ක් ඉතිරි වී තිබුණි.

අමාත්‍යාංශ 2 ක් විසින් එවා තිබුණු එකතුව රු.424,602 ක් හා දෙපාර්තමේන්තු 2 ක් විසින් එවා තිබුණු එකතුව රු.110,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් කර නොතිබුණු අතර තවත් දෙපාර්තමේන්තුවක් විසින් එවා තිබුණු රු. 6,526,580 ක ප්‍රතිපාදන රු. 44,843 කින් ඉක්මවා රු.6,571,423 ක් උපයෝජනය කර තිබුණි.

2:2 <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම</u>

<u>පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්</u>

විෂය අංක 25701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 58,875,000 | 67,604,205 | 35,000,000 | 57,381,095 | 270,000,000 | 216,548,182 |

2:3 <u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය</u>

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2:5 සිට 2:10 ජේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) <u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| අලාභ හානි ලේඛනය | මු.රෙ. 110 | අලාභ හානි ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| පරිගණක හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක: IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ආ) <u>සංයුක්ත සැලැස්ම</u>

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඇ) <u>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>

ඉහත (ආ) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 වර්ෂය සහ ඉන් ඉදිරියට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඈ) <u>වාර්ෂික කාර්යසාධන වාර්තා</u>

ඉහත (ආ) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2012 ජූලි 23 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ඉ) <u>වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම</u>

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2011 මැයි 04 දිනදීය.

(ඊ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය</u>

විෂය අංක 25701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2011 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,780,626 ක් වූ අතර එම ශේෂවලින් වර්ෂ 1 ට වැඩි 2 ට අඩු රු.423,167 ක්ද, වර්ෂ 3 ට වැඩි රු.105,623 ක්ද 2013 අප්‍රේල් වන විටත් හිඟව පැවතුණි.

2:4 **<u>වත්කම් කළමනාකරණය</u>**

(අ) **<u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

ගෘහභාණ්ඩ සහිත පැරණි දිස්ත්‍රික් ලේකම් නිල නිවස සහ ඊට අදාල ඉඩම 2006 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව තිබුණු අතර 2010 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් පුහුණු ඒකකයක් පිහිටුවීම සඳහා ලැබී තිබූණු ප්‍රතිපාදන මත රු.1,159,501 ක වියදමකින් අළුත්වැඩියා සිදු කර තිබුණද 2012 සැප්තැම්බර් දක්වාම එය නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) **<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවතින විවිධ අංශ සඳහා වෙන වෙනම ඉන්වෙන්ට්‍රි ලේඛන භාවිතා කිරීමක් සිදු වී නොතිබුණි.

(ii) ප්‍රධාන ගබඩාවේ ඇති ආංශික ඉන්වෙන්ට්‍රිය පදනම් කරගෙන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණි.

(iii) 2008 වර්ෂයේදී රු.40,500 ක් වැය කර "සයන්ස් ලැන්ඩ් " ආයතනය මගින් ස්ථාවර වත්කම් පාලන පරිගණක වැඩසටහන (Assets Control System) මිලදී ගෙන තිබුණද 2011 වර්ෂයේදීත් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) **<u>වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම</u>**

වෙනත් ආයතන සතුව තිබුණු පහත වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**<u>ස්ථාවර වත්කම්</u>**

සුනාමි ව්‍යසනයේදී රාඩා ව්‍යාපෘතිය යටතේ 2006 වර්ෂයේදී නාගරික සංවර්ධන හා ජලාපවාහන අමාත්‍යාංශය මගින් ලබාදී තිබූ යතුරුපැදි 06 ක් ව්‍යාපෘතිය අවසන් වීමෙන්පසු ප්‍රයෝජනයට නොගෙන හෝ අදාල ආයතනයට භාර නොදී නිෂ්කාර්යව පවතී.

(ඈ) **<u>බේරුම් නොකළ බැරකම්</u>**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂයක් නොඉක්මවූ බේරුම් නොකළ බැරකම් රු.2,875,922 ක් විය.

වැය විෂයයන් 04 කට අදාල ඉහත බැරකම් විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

2:5. <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා</u>

ව්‍යාපෘති ආරම්භ කර නිම නොකර අත්හැරදැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) <u>ව්‍යාපෘති නිම නොකර අත්හැරදැමීම්</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2011 දෙසැම්බර් 31 දිනට වියදම | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| බණ්ඩියාවල ඇළ ප්‍රතිසංස්කරණය | 742,638 | 2011.12.07 | 527,362 | දක්වා නොතිබුණි. |

(ආ) <u>ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2011 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| කළුතර උතුර මාතෘ සායනය නවීකරණය කිරීම | 3,262,575 | 2012.05.02 | 2011.12.31<br>2012.02.15<br>2012.08.02<br>2012.08.31 | -- | වැඩ ආරම්භ කිරීම ප්‍රමාදවීම |

ඇස්තමේනතු වටිනාකම රු. මිලියන 03 ඉක්මවන ලද අවිච්ජේද ව්‍යාපෘතියක් වූ ඉහත ව්‍යාපෘතියේ ගිවිසුම්ගත කාලසීමාව ඉක්මවා තිබුණද 2012 සැප්තැම්බර් 20 දින වන විටද නිම වී නොතිබුණු බැවින් එම සායනය සඳහා ලබා ගත් රු.582,882 ක් වටිනා භාණ්ඩ වෙනත් ස්ථානයක නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) <u>මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති</u>

(i) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සංස්කෘතික මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීමට රු.380,000 ක් ලබා දී තිබුණි. ගොඩනැගිල්ලේ වහලයට සර්ලන දැව ප්‍රමාණයන් යොදා නොතිබීම, දැවවල ආරක්ෂිත තීන්ත ආලේප කර නොතිබීම හා වැහි පීලි,

පයිප්ප ආදිය යොදා නොතිබියදීත් සියළුම ගෙවීම් කර තිබුණු අතර එකී අඩුපාඩු 2012 අගෝස්තු වන විටත් නිම කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) 2012 වර්ෂයට අවිච්ඡේදව පැවති 2011 ගම නැගුම ව්‍යාපෘතිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බොලොස්සගම මාතෘ සායන ගොඩනැගිල්ලට අවශ්‍ය උපකරණ ලබා දීම සඳහා රු.569,662 ක ප්‍රතිපාදනයෙන් මිලදී ගත් භාණ්ඩ භාර නොදී කාර්යාල ගබඩාවේ රඳවාගෙන තිබුණි.

2:6 <u>බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු</u>

(අ) <u>ගැලපුම් කළ යුතු ශේෂ</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් විසින් 2011 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු | එකතුව |
|---|---|---|
| | රු. | රු. |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 42,272 | 42,272 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ගිණුමේ දක්වා තිබූ තොරතුරු අනුව මාස 06 ඉක්මවූ චෙක්පත්වල වටිනාකම රු.39,242 ක් ලෙස දක්වා තිබුණද එය රු.42,272 ක් විය යුතු බව නිරීක්ෂණය විය. ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.3,030 ක චෙක්පත් 04 ක් ගිණුමට ඇතුළත් කර නොතිබුණි.

2:7 <u>අවිධිමත් ගනුදෙනු</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) බණ්ඩාරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රු.12,297,453 ක් වටිනා ගොඩනැගිල්ල ඉදිකිරීමට ටෙන්ඩර්කරුවන් තෝරාගැනීමේදී සුදුසුකම් පරීක්ෂා කළ ආකාරය පිළිබඳ සාක්ෂි කිසිවක් විගණනයට ඉදරිපත් නොකරන ලදී.

(ආ) 2011 වර්ෂයේදී පුනරුත්ථාපනය හා වැඩිදියුණුකිරීම් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු.2,283,844 ක ප්‍රතිපාදන සළසා තිබුණද එයින් 2010 වර්ෂයට අදාලව රු.825,875 ක් වැයකර තිබුණි. 2010 වර්ෂයේදී එම කාර්යයන්ට ප්‍රතිපාදන නොමැතිව බැරකම්වලට එළඹ තිබුණි.

2:8 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

**<u>අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා</u>**

2011 දෙසැම්බර් 31 දිනට වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | -- |
| (ii) | තෘතීයික මට්ටම | 63 | 60 | 03 |
| (iii) | ද්විතීයික මට්ටම | 1,212 | 1,171 | 41 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 143 | 143 | -- |
| | | 1,419 | 1,375 | 44 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 44 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.

2:9 **<u>අභ්‍යන්තර පාලනය</u>**

**<u>විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම</u>**

2009 ජූනි 09 දිනැති අංක DMA/2009/(1) චක්‍රලේඛයේ 6 ජේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව යටත් පිරිසෙයින් අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්විය යුතු වුවත් 2011 වර්ෂය වෙනුවෙන් එක් වරක් පමණක් රැස්වී තිබුණි.